# ලංකාවේදී හඳුනාගත්

# ජාන තාක්ෂණික ආහාර

ජාන තාක්ෂණික ආහාර පිළිබඳව අද ලොව විවිධ රටවලින් විවිධ මත පළවේ. මෑතකදී ජාන තාක්ෂණික ආහාරයක් ලෙස නිපදවූ රත්වත් සහල්වලින් ලොව ආහාර හිඟයට පිළියමක් ලැබෙන බව එය නිපදවූ පර්යේෂකයෝ කියති.

මීට අමතරව විප්ලවයෙන් පසු වැඩිවන ජනගහණයට අවශ්‍ය ආහාර සැපයුම සඳහා ජාන තාක්ෂණික ආහාරවලින් ඉමහත් පිටු බලයක් ලැබෙන බව ඇතැම් පර්යේෂකයන්ගේ මතය වී ඇත.

එසේ වුවත් ජාන තාක්ෂණික ආහාරවල ප්‍රශ්න ඇතිවූ අවස්ථා ද ඇත. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය උපාලි සමරජීව මහතා පවසන පරිදි මේ ජාන තාක්ෂණික ආහාර නිසා පසුගිය වසර 10 – 15 ක කාලය තුළදී මරණ ගණනාවක් ම සිදුවී තිබේ. ඊට අමතරව මේ ආහාර නිසා රෝගී බවට පත්වූ පුද්ගලයන් ගණනද විශාල වේ.




දැන් දැන් ලැබෙන වාර්තා අනුව ශ්‍රී ලංකාවට ද ජාන තාක්ෂණික ආහාර ගෙන්වීම එළිපිටම සිදුවන බව දකින්නට තිබේ.

පසුගිය කාලයේ මේ ආහාර සඳහා තහනමක් පැනවූවද එය පසුව ඉවත් කෙරිණි. මේ අනුව දැනට වසර 2 කට අධික කාලයක් තිස්සේ මෙරටට ගෙන්වන ජාන තාක්ෂණික ආහාර පිළිබඳ හඳුනාගැනීමට කිසිම සාධකයක් නැත.

ශ්‍රී ලංකා හරිත විද්‍යාඥයන් පවසන පරිදි මේ ආහාර වැඩිපුර ගෙන්වන්නේ ඇමරිකාව, ඔස්ට්‍රේලියාව, ජපානය, ප්‍රංශය යන රටවලිනි. ඒ අනුව තක්කාලි සෝස්, චොක්ලට්, කිරිවර්ග, කිට් කැට් චොක්ලට්, කුළුබඩු වර්ග, සිසිල් බීම වර්ග, ආදි ආහාර වර්ග ගෙන්වන බව ශ්‍රී ලංකා හරිත විද්‍යාඥයෝ පවසති.

ජාත්‍යන්තර ග්‍රීන්පීස් වෙබ් අඩවියෙන් ලබාගත් ජාන තාක්ෂණික ආහාර ලෙස හඳුන්වනු ලැබූ ආහාර ලැයිස්තුව ආශ්‍රයෙන් අහඹු වෙළඳපල සමීක්ෂණයකින් ලංකාවේදී හඳුනාගත් ජාන ආහාර

ධාන්‍යයෙන් තැනූ ආහාර Cereals
කොලොග්ස් Kolog's
කෝන් ප්ලේග්ස් Corn Flakes
රයිස් බබල්ස් Rice Bubbles
ෆෲට් ලූප්ස් Froot Loops
ඕල් බ්‍රෑන් All Bran
හනී ක්‍රන්ච් කෝන් ප්ලේග්ස් Honey Crunch Corn Flakes
චොක්ලට්ස් Chocolates
කැඩ් බරි ඩයරි මිල්ක් Cad Bury – Dairy Milk
හර්සීස් Hersheys
කිට් කැට් Kit Kat
ස්නිකස් - Snickers
ටුවික්ස් - Twice
ටොබ්ලරන් Toblerone
ක්‍රන්ච් Crunch
මිල්ක් චොක්ලට් Milk Chocolate
කුළු බඩු Condiments
තෙල් විනාකිරි Dressing Salad Oil
හෙන්ස් කෙචිප් Heinz - Kepchup
මෙයෝනිස් - Mayonnaise
වෙසන් ඔයිල්ස් - කෝන් Wezzon Oils Corn
කැනෝලා ඔයිල් Canola Oils
ඩ්‍රෙසින්ස් Dressing
ඩ්‍රෙසින්ස් සෙස්ටි Dressing Zesty
සිසිල් බීම Soft Drink
කෝලා Cola

බොහෝවිට ලංකාවේ හමුවිය හැකි ජාන තාක්ෂණික ආහාර විශේෂ සංඛ්‍යාව මීට වඩා ඉහළය. ජාන තාක්ෂණික ආහාර වලින් කෘෂි විද්‍යාව සුරැකීමටත් විශේෂයෙන් අපේ ළමා පරපුර සුරැකීමටත් යම් ක්‍රමයත් අනුගමනය කළ යුතු බව මෙරට පරිසරවේදීන්ගේ අදහසයි. මේ පිළිබඳව අදහස් දැක්වූ හරිත ව්‍යාපාරයේ වැඩ සටහන් කළමනාකරු ඩග්ලස් කුමාර පවසන්නේ සම්පූර්ණයෙන්ම අපනයනය කිරීම නතර කළ යුතු බවයි.

❑

**නිහාල් පී. අබේසිංහ**